# 1.21 නූර්ති සංගීතයෙහි භාවිත තබ්ලා සහාය වාදන කලාව පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

පී.එච්.එස්. දේශප්‍රිය
දෘශ්‍ය කලා සැලසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

## ABSTRACT

නූර්ති සංගීතයෙහි භාවිත තබ්ලා සහාය වාදන කලාවට විශේෂ වූ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයෙන් අනාවරණය කරගත් කරුණු කිහිපයක් මතු කොට දැක්වීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ යි. ක්‍රි. ව 19 වන සියවස අග භාගයෙහි (ක්‍රි. ව 1870-1899) ලංකාවට සම්ප්‍රාප්ත වූවායැයි සැළකිය හැකි තබ්ලා වාද්‍යය මෙරට සංගීත ක්ෂේත්‍රයෙහි භාවිතයට පැමිණියේ නූර්ති නාටකයන්ගේ ව්‍යාප්තිය හා සමගාමීවය. දශක තුනක පමණ කාලයක් තුළ මෙරට ව්‍යවහාරයේ පැවති නූර්ති සංගීතයෙහි අනන්‍යතාව හා ජීවය රඳාපැවතියේද එහි භාවිත තබ්ලා වාදන ශෛලිය මතය. කව්වාලි, ගස'ල්, ධ්‍රැපද්, වැනි භාරතීය අර්ධ ශාස්ත්‍රීය ගායන ආකෘතීන් හා බොහෝ සමානකම් දක්නට ලැබිය හැකි නූර්ති ගීතයන්හීදී භාවිත සහාය වාදනය වර්තමානයේ හඳුනාගත හැකි සරල ගීත ආකෘතියෙන් පරිබාහිර වන්නකි. මේ පිළිබඳව කරන ලද අධ්‍යයනයේ දී පහත සඳහන් නිගමනයන්ට එළඹිය හැකි විය.

- නූර්ති සඳහා යෙදුණු සහාය වාදනයේ දී මූල පද හෙවත් ඨේකා භාවිතය ප්‍රමුඛ වූ අතර නූර්ති සංගීතයට පමණක්ම ආවේණික වර්තමානයේ භාවිතයෙහි විරල මූල පද හඳුනාගත හැකි වීම.
- එම තාල, ගීතයේ අවස්ථානුකූල භාවිතය සහ රස සහ භාව සිද්ධාන්තය මත පදනම් වීම.
- මොහොරා(මෝහරා), තෝඩා, පරන්, චල්ති වැනි ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක පද හෙවත් බෝල් (Bols) වර්ග භාවිතය.

නූර්ති සංගීතයෙහි භාවිත තබ්ලා සහාය වාදන කලාව පිළිබඳ කරුණු විග්‍රහ කරමින් පූර්වෝක්ත නිගමනයන්ට එළඹී ආකාරය පැහැදිලි කිරීමට අපේක්ෂිතය.